# අප දේශය වෙනුවෙන් දෙවියන් වහන්සේ ඉදිරියේ මැදිහත්වීමේ පශ්චත්තාපයේ මෙහෙය

අපි මේ මොහොතේ මනස්ථාපනය සඳහා සූදානම් වෙමු. අද දවසේ තේමාව ලෙස අපි රැගෙන තියෙනවා, 2වංශාවලිය 7:14 වන පදය. එය අපි සියළු දෙනාම කට පාඩමෙන් වාගේ දන්නවා.

> **"මාගේ නාමය දරණ මාගේ සෙනඟ බැගෑපත් වී, යාච්ඤා කර, මා සොයා තමන්ගේ නපුරු මාර්ග අතහැරියොත්, මම ස්වර්ගයේ සිට එය අසා, ඔවුන්ගේ පව් කමා කොට ඔවුන්ගේ දේශයට සෙත සලසන්නෙමි."**

ප්‍රේමවන්තයිනි, මේ පදය තුළ විශාල පණිවුඩයක් , ඒ වගේම පුදුමාකාර පොරෙන්දුවක්,ඒ වගේම දෙවියන් වහන්සේ අපගෙන් ඉල්ලන යම් යම් දේවල් අපට දැකගන්නට පුලුවන්. පළමුව අප මේ වචනය දෙස බලද්දී ඔවුන් වහන්සේ මේ කථා කරන්නේ මුළු ලෝකයේම ඉන්න ජනතාවට නොවෙයි. ඔවුන් වහන්සේ කථා කරන්නේ ඔවුන් වහන්සේව හොඳින් හඳුනන, ඔවුන් වහන්සේව තමන්ගේ දෙවියන් වහන්සේ හැටියට බාරගෙන සිටින, ඔවුන් වහන්සේට ආදරය කරන ජනතාවක් අමතායි.

**"මාගේ නාමය දරණ...."** බලන්න දෙවියන් වහන්සේගේ නාමය දරණ ජනතාවට. මාගේ කියලා කියන්නේ දෙවියන් වහන්සේට අයිති ජනතාවට. ප්‍රේමණීය ජනතාවකට. ඊට පස්සෙ කියනවා **"මාගේ සෙනග...."** හැම දෙනාටම කථා කරන්නේ නැහැ. ඔවුන් වහන්සේව බාරගෙන ඉන්න ජනතාවට. ඔවුන් වහන්සේගේ සෙනගටයි ඔවුන් වහන්සේ කථා කරන්නේ.

ඒ නිසා අද දවසේදී මේ වචනය ඔවුන් වහන්සේ කථා කරන්නේ අපට කියලා අපි තදින්ම විශ්වාසයෙන් අල්ලා ගන්නට ඕනේ. මොකද්ද ඔවුන් වහන්සේ කියන පළමුවන දේ? මනස්ථාපනයට අපි ඇතුළත් කරද්දී බැගෑපත් වී, බැහැපත් වී. බලන්න අපට අමාරුම දෙයක් තමයි බැහැපත් වන්න. දැන් අපි ප්‍රකාශ කරද්දී කිතු දන පුබුදුව අවුරුදු 4ක දීර්ඝ කාලපරිච්ඡේදයක් මනස්ථාපනය සඳහා යොමු කරනවා කියලා, කොහෙන් හරි දෙතුන් දෙනෙක් කියලා තියෙනවා, 'ඕක හොඳයි පුබුදුවට; පුබුදුව එච්චර පව් කරලා ඒක නිසා ඒගොල්ලෝ සමාව ඉල්ලන්න ඕනේ.' එතකොට දැන් මේ කියන අයත් පුබුදුවේ. එතකොට ඒ අය හිතන්නේ නැහැ මමත් පව් කරලා කියලා. ඒ අය අනිත් අය වෙත ඇඟිල්ල දික් කරනවා.

දැන් ස්වාමීන් වහන්සේ අපට දෙන පළවෙනි කොන්දේසිය තමයි 'බැගෑපත් වී' අපි බැහැපත් වෙන්න ඕනේ ප්‍රේමවන්තයිනි, මේ ශුද්ධවූ දෙවියන් වහන්සේ ඉදිරියෙහි අපි පව්කාරයෝ බව, ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්තට අපි එරෙහිව ගමන් කරලා තිබෙන බව අපි පිළිගන්නට ඕනේ. ඉන් පස්සේ ඔවුන් වහන්සේ මොකද කියන්නේ? **'බැගෑපත් වී යාච්ඤා කර මා සොයා'** බැහැපත්ව අපි යාච්ඤා කරන්න ඕනේ. අපි පුරසාරම් දොඩ දොඩ යාච්ඤා කළොත් අරයගෙයි පාපය කියලා, ඒක හරියට අර පරිසිවරයයි, වැන්දඹු ස්ත්‍රියයි දේව මාළිගාවට ඇවිල්ලා අර කාසි දැම්මා වගේ. අර ස්ත්‍රිය දැම්මේ එක තඹ සතයයි. නමුත් ඇය ඈ සතු සියල්ල දැම්මා. අපි අදත් ඒ වැන්දඹු ස්ත්‍රිය ගැන කථා කරනවා. ඇයි? ඇගේ බැහැපත්කම ගැන. ඒ නිසා බැහැපත්ව යාච්ඤා කිරීම ඉතාම වැදගත්. ඒ නිසා අපේ අහංකාරකම ගැන අපි සමාව අයැද සිටින්නට ඕනේ. **'මා සොයා..'** අපි සොයන්නට ඕනේ ස්වාමීන් වහන්සේවයි. එතකොට අපට වැරදුනු තැන් උන්වහන්සේ පෙන්වා දෙයි. **'නපුරු මාර්ග අත්හැරියොත්'** අප සතු නපුරු මාර්ග අති බොහෝයි ප්‍රේමවන්තයිනි. අප සතු නපුරු මාර්ග ගොඩක් තියෙනවා.

බලන්න පළවෙනි නපුරු මාර්ගය තමයි එකමුතුකමේ ජීවිතයකට විරුද්ධව සිටීම. අපි සෑම වෙලේම සන්ඩු දබර කරනවා. ස්වාමි පුරුෂයා - බිරිඳ අතර එකමුතුකමක් ආදරයක් නැහැ. දෙමව්පියෝ - දරුවන් අතර, නැන්දම්මා - ලේලිය අතර, අසල්වාසීන් අතර, එයින් ටිකක් ඔබ්බට ගියොත් පුබුදු ජනතාව අතර, නායකත්වයක් ගන්න අය අතර බලන්න. ඔබේ සංඝයේ මූලික එකතුන් දෙස බලන්න. ඔබේ සංඝයේ තියෙන ක්‍රියාකාරී එකතුව දෙස බලන්න. ප්‍රශංසා එකතුව තුළ කටයුතු කරන මූලිකයන් දෙස බලන්න. අපි ඇත්ත වශයෙන්ම එකමුතුකමේ ජීවිතයක් ගත කරනවාද? ඒ නිසා අපි මේ නපුරු මාර්ග දෙස බැලුවොත් තමයි ඒ නපුරු මාර්ග වලින් අපට ගැළවෙන්නට පුලුවන්. එකමුතුකමේ ජීවිතයකට

විරුද්ධව කළ සෑම වරදකටම අපි දෙවියන් වහන්සේගෙන් සමාව ඉල්ලන්නට ඕනේ.

- 02 -

ඉන් පස්සෙ බලන්න දෙවියන් වහන්සේ ගාවට ඇවිල්ලා අපි හැමදාම කියනවා , 'ස්වාමිනී මාගේ පාපයට සමාව දෙන්න' කියලා. මම සමාව ඉල්ලන සෑම අවස්ථාවකම උන්වහන්සේ සමාව දෙනවා. ඒත් මම මගේ සහෝදරයාට, මට වරද කරපු එක්කෙනාට මම සමාව දෙනවද? මෙන්න තවත් නපුරු මාර්ගයක්. අපි පොදුවේ අපි කරපු තව දෙයක් දිහා බැලුවොත්, බලන්න සමරිතානු මෙහෙයුම අපි සැලකිල්ලට ගත්තෙ නැති හැටි. අපි ඒක  අයාලේ යන්න සලස්සපු හැටි ගොඩක් අය.  ගොඩක් අය මහන්සි වෙලා වැඩ කළා. අපි නැහැ කියලා කියන්නෙ නැහැ, නමුත් දෙවියන් වහන්සේගේ සිහිනය එසේ උදා නොවන්නට අපි ගොඩක් දෙනෙක් දායක වුනු නිසා අපි ස්වාමින් වහන්සේගෙන්  සමාව අයැද සිටින්නට ඕනේ.

ස්වාමින් වහන්සේ කියනවා එසේ අපි අපේ නපුරු මාර්ග අතහැරියොත් ඔවුන් වහන්සේ ස්වර්ගයේ සිට මේ අපි කරන යාච්ඤාව අසලා, අපගේ පව්වලට සමාව දීලා, අපගේ දේශයට සෙත සලසනවා කියලා.  ප්‍රේමවන්තයිනි, අපි දැන් එකතු වෙලා ඉන්නේ අපේ දේශය වෙනුවෙන් දෙවියන් වහන්සේ ඉදිරියේ කන්නලව් කරන්න. අපි ඒ කන්නලව් යාච්ඤාවලට ඇතුළත් කරලා තියෙනවා ඉතා වැදගත් කරුණු රාශියක්.

1. ධර්මය පදනම් වූ රාජ්‍යයක් වෙනුවෙන් අපි යාච්ඤා කරන්න යනවා.
2. අල්පේච්ඡ ජීවිතය වෙනුවෙන් අපි යාච්ඤා කරනවා.

එතකොට අපේ ජීවිතය ධර්මය පදනම් වෙලාද ගොඩනැගිලා තියෙන්නේ?  ක්‍රිස්තුන් වහන්සේ අපට උගන්නපු දේද අපේ ජීවිතයේ පදනම? නැත්නම් එක එක පුද්ගලයන්ද? සිද්ධීන්ද? අපි හොඳට කල්පනා කරලා මනස්ථාපනය වෙන්නට ඕනේ, අපගේ යාච්ඤාව දෙවියන් වහන්සේ වෙතට එසවෙන්නට නම්. බලන්න අපේ රටේ තියෙන මූලික ධර්ම 4 පිළිබඳව.  ප්‍රධානතම ලකුණක් හැටියට අපි දැක්කා  සරල අල්පේච්ඡ ජීවිතය. ඔබයි - මමයි ගත කරන ජීවිතය සරල අල්පේච්ඡද? අපිට අවශ්‍ය. අතී අවශ්‍ය දේද අපි තියා ගන්නේ? නැත්නම් අපට අවශ්‍ය හැම දේම, නිකන් බොරුවට අනිත් එක්කෙනාට තියෙන නිසා ඒ තුළින් අපි අනිත් එක්කෙනා තුළ ක්‍රිස්තුන් වහන්සේව තනි කරනවද? හොඳට හිතන්න ප්‍රේමවන්තයිනි, ධරිද්‍රතාවයෙන් පෙලෙන්නාව අපි තවත් පාගා දමනවාද?

එතකොට අපි අද දවසේ යාච්ඤා කරනවා ඩෙංගු වසංගතය. මේ කුණු ප්‍රශ්නය වෙනුවෙන්. එයින් මරණ ජීවිතය අහිමි වූවන් වෙනුවෙන් අපි දෙවියන් වහන්සේ ඉදිරියේ මැදිහත් වෙන්නට යනවා. ඩෙංගු වසංගතයට ඔබත් මාත් පංගුකාරයන් වී තිබෙනවාද? මේ කුණු කන්දල් වලට ඔබත් මාත් පංගුකාරයන් වී තිබෙනවද? අවංකව සෝදිසි කරන්න ප්‍රේමවන්තයිනි. අපි කාලා විසි කරන ඒ පුංචි ටොෆි කොළය. අපි පාවිච්චි කරන සිලි සිලි බෑග් හැම තැනම විසි කරනවා. ඒවා කානු දිගේ යනවා.  ඒවා වලට වතුර එකතු වෙනවා, මදුරුවෝ ඒවායේ බිත්තර දානවා. මදුරුවෝ බෝ වෙනවා.  අපි සමහර අය මේ කුණු ගොඩවල්වලට මේ සිලි සිලි බෑග් දමනවා. පුච්චනවා.  එයින් පිටවෙල දුම ඉතාම විෂ දුමක් පිට වෙන්නේ. දුම නිසා ජනතාව, දරුවන් රෝගීන් බවට පත් වෙනවා. එතකොට මේ ඩෙංගු වසංගතයට රජය වගකිවයුතු වාගේම  මහ ජනතාව වන අපිත් වගකියන්න ඕනේ.

ඒ නිසා ප්‍රේමවන්තයිනි, මේ අපේ නපුරු මාර්ග දෙස අපිත් හොඳින් හැරිලා බලන්න ඕනේ මේ දවසේදී.  ඒ වගේම අපි පාප් වහන්සේගේ විශ්ව ලේඛණය ගොඩක් භාවනා කළා. ඒ වගේම මුළු විශ්වයම දෙවියන් වහන්සේගේ නිවහන ලෙස අපේ පොදු නිවහන ලෙස අපි භාර ගත්තා. ඇත්තටම මුළු විශ්වයම ඔබගෙයි මගෙයි පොදු නිවහනද? අපි එලෙස හැම දෙනාටම ආදරය කරනවාද?  ගස් කොලන් වලට, සතා සිව්පාවාට, ගස් කොලන් ආරක්ෂා කරන්නට.  නැත්නම් අපේ වත්තෙ තියෙන ගස් ඔක්කොම කපලා අපි පුච්චලා දානවද? බලන්න ශ්‍රී ප්‍රශංසාරාමයේ කවදාවත් කුණු පුච්චනවා මම දැකලා නැහැ, ගහක් කපන්නෙ නැහැ ලේසියෙන් අතී අවශ්‍ය නැත්නම්. ස්වාමි තාත්තා එලෙස සොබාදහම ආරක්ෂා කරන්න අපිට උගන්නලා තියෙනවා. ඒ නිසා අපිට වැරදුනු තැන් අපි කුඩා කණ්ඩායම් වලට බෙදිලා අපි ගැඹුරු මනස්ථාපනයකට යොමු වෙන්නට ඕනේ.

ප්‍රේමවන්තයිනි, ඔබව ශුද්ධාත්මයාණන් මෙහෙයවනවා නම් ඔබේ පුංචි කණ්ඩායමේ ඔබ අතින් වුනු වැරදි ඔබ අවංකවම කියන්න. අපි වැරදි උච්චාරණය කරන ප්‍රමාණයට තමයි අපිට ඒකෙන් ගැලවීමේ බලය අපට අයිති කරගන්න පුලුවන්. ඉන් පස්සෙ අපි එක එක්කෙනා උදෙසා යාච්ඤා කරමු.ඉන් පස්සෙ අපි පොදුවේ යාච්ඤා කරමු අපගේ පාපයන් නිසා. අපි සැබෑ මනස්ථාපනයකට අද දවසේ අපි ඇතුළත් වෙමු. අපි අපගේ නපුරු මාර්ග වලින් හැරෙන්නට ගැඹුරු මනස්ථාපනයක් අපි අයිති කර ගනිමු. බලන්න ගිය මෛත්‍රී මාසික කඳවුරේදී ප්‍රබෝධය සංඝය අපෙන් ඉල්ලුවා යම්කිසි බෑග් එකක්. රෙදි බෑග් එකක ඔබගේ ශුද්ධවූ බයිබලය දාගෙන එන්න කියලා. අපි හැම කෙනෙකුටම රෙදි බෑග් එකක් තියෙනවද අපේ ශු.බයිබලය දාගෙන යන්න. නැත්නම් අපි තවම සිලි සිලි බෑග්වලද අපේ බයිබල් දාගෙන යන්නේ. අපි කඩයට යද්දී රෙදි බෑග් එකක් අරගෙන යනවද අපේ බඩු ටික දාගෙන එන්න. නැත්නම් අපි කඩේ ගිහිල්ලා සිලි බෑග් 9-10ක් අරගෙනද ගෙදර එන්නේ.

බලන්න අපි හැදෙන්න ඕන දේවල්. බලන්න අපේ නපුරු මාර්ග. අපි සිලි සිලි බෑග් වපුරනවා නම් අපි මදුරුවන්ව වපුරනවා. අපි කුණු කන්දවලුත් වපුරනවා. ඒ නිසා අපට හිතන්න බොහෝ දේවල් තියෙනවා.

ප්‍රේමවන්තයිනි, මම ඔබට පුංචි අතදීමක් පමණයි ඔබට කළේ. ඔබගේ පාපයන් ඔබ දන්නවා. ඔබගේ ලිංගික පාපයන්, ඔබගේ විවාහ සක්‍රමේන්තුව අලංකාරව නොතබා ගන්න අවස්ථාවන්? ඒ වගේම අවිවාහිකව අපි ලිංගිකව සම්බන්ධ වෙනවා නම්, ඒ වගේම අපි මාංශික තෘෂ්ණාවලට විරුද්ධව මාංශික ක්ලේශයන් තෘප්තිමත් කරන්නට, පංචේන්ද්‍රියන් තෘප්තිමත් කරන්නට අපි පාපයේ ඇලී ගැලී සිටිනවා වෙන්නට පුලුවන්. ඒ වගේම අපි මුල් අගුණ පව් 7ට එවැනි පාපයන් වලට අපි නිරන්තරයෙන් වැටෙන්නට පුලුවන්. ඒ වගේම අපේ ඝනයේ පෙළඹීම් නිසා ඇතිවන ඒ පාපයන් වලට අපි පෙළඹෙන්න පුලුවන්. අපිට පස් පව් ගැන ස්වාමි තාත්තා කියලා දීලා තියෙනවා. ඒ පස් පව් අපගේ නරක මාර්ග අපගේ පවුල් දෙදරන්නට හේතු වෙලා තියෙන්නට පුලුවන්. සමහර විට අපගේ ප්‍රශංසා ගම් පවා කැඩෙන්නට බිඳෙන්නට අපගේ මේ පාපයන් හේතු වෙලා තිබෙන්නට පුලුවන්.

ඒ නිසා ප්‍රේමවන්තයිනි, අද අපි යාච්ඤා කරන්නේ අපේ දේශය වෙනුවෙන්. අපේ දේශයට සෙත සලසන්න කියලයි. ඒ නිසා එසේ සිදුවන්නට නම් පළමුවන දේ තමයි අපගේ සැබෑ මනස්ථාපනය. ඒ නිසා මම ඔබට දුන්නේ පුංචි අතදීමක් පමණයි. ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබේ පාපය පෙන්වා දෙයි. ශුද්ධාතත්මයාණන් පැමිනි කල පාපය කුමක්දැයි පෙන්වා දෙන සේක. මම නැවතත් ඒ බලගතු දේව වචනය ඔබ ඉදිරියේ තබන්නම්.

**"මාගේ නාමය දරණ මාගේ සෙනඟ බැගෑපත් වී, යාච්ඤා කර, මා සොයා තමන්ගේ නපුරු මාර්ග අතහැරියොත්, මම ස්වර්ගයේ සිට එය අසා, ඔවුන්ගේ පව් කමා කොට ඔවුන්ගේ දේශයට සෙත සලසන්නෙමි."**

- ආමෙන් -

***********************